දිසානායක, එම්. කේ. බී., තැපැල්පති, තැපැල් දෙපාර්තමේන්තුව
*Paper: Transformability*

# තැපැල් දෙපාර්තමේන්තුවේ මුදල් ඇණවුම් සේවා පරිපාටිය කාර්යක්ෂම කිරීම පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයනය

19 වෙනි සියවසේ සිටම මුදල් හුවමාරු ක්‍රමයක් හැටියට විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රචලිතව තිබුණේ තැපැල් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබූ මුදල් ඇණවුම් සේවාවයි. මුදල් ඇණවුම් සේවාවේ තිබෙන දුර්වලතා හා ගැටලු හඳුනාගෙන මහජනතාවට වඩාත් කාර්යක්ෂම මුදල් හුවමාරු සේවාවක් ලබාදීමට අවශ්‍ය ක්‍රමෝපායයන් හා රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ ලෙස භාවිතා කළෙමි.

මුදල් ඇණවුම් ක්‍රියාදාමය ප්‍රධාන ගණකාධිකාරීවරයාගේ අධිකාරියට යටත් වන අතර මුදල් ඇණවුම් සේවාව සම්බන්ධයෙන් පමණක් ම ක්‍රියා කිරීමට පාලක (මුදල් ඇණවුම් සේවා) ලෙස ධූරාවලියේ තෙවන ස්ථරයට ගැනෙන තනතුරක් ස්ථාපනය කර ඒ සඳහා විශේෂිත කාර්යාලයක් සහ කාර්ය මණ්ඩලයක් ද ලබා දී ඇත. ඒ අනුව, මුදල් ඇණවුම් සම්බන්ධයෙන් පාලක (මුදල් ඇණවුම් සේවා) ප්‍රධාන ගණකාධිකාරීවරයාටත්, ප්‍රධාන ගණකාධිකාරීවරයා තැපැල්පතිවරයාටත් මුදල් ඇණවුම් සේවාව සම්බන්ධයෙන් වගකිව යුතු ය.

- ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරුව ශක්තිමත් කිරීම
- කෙටි පණිවිඩ හරහා මුදල් හුවමාරු ක්‍රමවේදයක් හඳුන්වාදීම
- ඉලෙක්ට්‍රොනික සහ කෙටි පණිවිඩ මුදල් ඇණවුම් සේවාව වෙනත් ගෙවීම් මාධ්‍යයක් වශයෙන් භාවිතා කිරීමට හැකිවන සේ නිර්මාණය කිරීම
- ඉලෙක්ට්‍රොනික ක්‍රමවේදය හරහාම කාර්යාල ගිණුම් පවත්වාගෙන යාම
- මුදල් ඇණවුම් බෙදා හැරීමේදීම අදාළ දත්ත පද්ධතියට අංක ඇතුළත් කිරීම
- බාකෝඩ් සහිතව මුදල් ඇණවුම් මුද්‍රණය කිරීම

ඉහත විකල්ප යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ප්‍රතිපත්ති යෝජනා කරමි.

- ඊ රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිගැනීම
- මුදල් ඇණවුම් ක්‍රමවේදයට අනුකූල වන පරිදි නීති රීති වෙනස් කිරීම
- ඉලෙක්ට්‍රොනික සහ කෙටි පණිවිඩ මුදල් ඇණවුම් ගෙවීම් මාධ්‍යයක් ලෙස පිළිගැනීම
- තැපැල් හා උප තැපැල් කාර්යාල සියල්ල තොරතුරු තාක්ෂණයෙන් සම්බන්ධ කිරීම.
- තැපෑලේ සියලු සේවාවන් තොරතුරු තාක්ෂණය යොදා කාර්යක්ෂම කිරීම
- බඳවා ගැනීමේදී හා උසස් කිරීමේදී තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ඇති පුද්ගලයන් බඳවා ගැනීම.
- දැනට සිටින සියලුම නිලධාරීන් හා සේවකයන්ට තොරතුරු තාක්ෂණය පිළිබඳ පුහුණුවක් ලබා දීම.